# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,228 - 2021 මැයි මස 13 වැනි බ්‍රහස්පතින්දා - 2021.05.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | 1156 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1157 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | — |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1166 |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජුනි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 මැයි මස 21 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීම**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2021***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2021.05.17 දින පස්වරු 2.00 දක්වා අදළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාර ගනු ලැබේ. එදිනම ප. ව. 2.05ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | මිල ගණන් භාර ගන්නා ස්ථානය | ආසන්න නගරය | නිවස අවශ්‍ය දිනය |
|---|---|---|---|---|---|
| සබරගමු පළාත | රත්නපුර | කලවාන | පළාත් සර්වේයර් ජනරාල් (සබරගමුව පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, නව නගරය, රත්නපුර | කලවාන අවට නගර | 2021.07.01 |

**සපුරාලිය යුතු පොදු අවශ්‍යතා**

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නල පහසුකම් තිබිය යුතු අතර, අපද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙනම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය. අවම වශයෙන් වාහන තුනක් නවතා තැබීමට පහසුකම් හා ගරාජ පහසුකම් තිබිය යුතු ය. මායිම් ගල් සකස් කිරීම සඳහා ඉඩ පහසුකම් තිබිය යුතු අතර, නිලධාරින් දහදෙනෙකුට ප්‍රමාණවත් කාමර හෝ ඉඩ පහසුකම් ද තිබිය යුතු ය. ගොඩනැගිල්ලේ වර්ග ප්‍රමාණය අවම වශයෙන් වර්ග අඩි 2500ක් හෝ ඊට වැඩි විය හැක.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි ''ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදළ ස්ථාන නාමය) '' යනුවෙන් සඳහන් කර, 2021.05.17 දින පස්වරු 02.00ට පෙර ලැබෙන සේ සබරගමුව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

ඒ. එල්. ශ්‍යාමලී චිත්‍රලේඛා පෙරේරා,
සර්වේයර් ජනරාල්,

2021 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2021**

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම් පත්‍රය - 2021**

*ගොඩනැගිලි අයිතිකරුගේ :*

1. සම්පූර්ණ නම :
2. ලිපිනය :
3. දුරකථන අංකය :
4. ජාතික හැඳුනුම්පත් අංකය :

ගොඩනැගිල්ල :

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද ?
2. මාසික කුලී මුදල :
3. පිහිටි ස්ථානයේ ලිපිනය :
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි මී.
5. භූමියේ විශාලත්වය :
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර :
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේද ?
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේද ?
9. ආරක්ෂික මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/........)
10. නවතා තැබීමට හැකි වාහන ගණන :

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

.............................,
අයදුම්කරුගේ අත්සන.

05 - 248

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - ඇඹිලිපිටිය

### රාජසන්තක කරනු ලැබූ, හිමිකම් නොකියන ලද වාහන සහ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ, නඩු අංක සහිත හා මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද වාහන සහ භාණ්ඩ 2021.06.06 වැනි දින පෙ. ව. 09.30ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම වෙන්දේසිය සඳහා ඉදිරිපත් කර ඇති වාහන සහ භාණ්ඩ පිළිබඳ අයිතිවාසිකම් කියන තැනැත්තෙකු වෙතොත් වෙන්දේසිය පවත්වනු ලබන දිනයට පෙර ලිඛිතව ඒ බව අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැන්විය යුතු ය.

රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැයකට පෙර විකිණීමට නියමිත වාහන සහ භාණ්ඩ ගැනුම්කරුවන්ට පරීක්ෂා කර බැලිය හැක.

අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවකදී අධිකරණයේ අභිමතය පරිදි එම වාහන සහ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතු ය.

වෙන්දේසියේදී මිලදී ගනු ලබන වාහන සහ භාණ්ඩ සඳහා එම අවස්ථාවේදීම මුදලින් ගෙවීම් කළ යුතු අතර, එදින ප. ව. 04.00ට පෙර එම වාහන සහ භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

මුදල් ගෙවීමේ දී හා වාහන හා භාණ්ඩ භාර ගැනීමේ දී වාහන සහ භාණ්ඩ මිලදී ගත් පුද්ගලයා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

මෙම වෙන්දේසිය පිළිබඳ පැමිණිලි කිසිවක් වෙතොත් වෙන්දේසි දින රාජකාරී අවසන්වීමට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දිය යුතු අතර, පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

මෙම වෙන්දේසිය පිළිබඳ සියලුම කටයුතු අධිකරණයේ අභිමතය පරිදි සිදු කරනු ලබන බව දන්වා සිටිනු ලැබේ.

කේ. පී. ආර්. ලක්මිණි විදානගමගේ,
මහෙස්ත්‍රාත්/අතිරේක විනිසුරු,
ඇඹිලිපිටිය.

2021 අප්‍රේල් මස 23 වැනි දින,
ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *ලියාපදිංචි අංකය* | *වාහනය* |
|---|---|---|---|
| 1. | 13358/15 | LZOXCBL-0561010120 | ලොන්සින් වර්ගයේ යතුරු පැදිය (කැබලි සඳහා) |
| 2. | 15934/15 | SG - GM 4948 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 3. | 33863/16 | 95 ශ්‍රී 6961 | හොන්ඩා 90 යතුරු පැදිය (කැබලි සඳහා) |
| 4. | 72129/20 | SG - MZ 7813 | TVS PLAME වර්ගයේ යතුරු පැදිය |
| 5. | 62678/11 | SG -LM 5112 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 6. | AR896/18 | 87-4083 | තැපැල් නයින්ටි යතුරු පැදිය (කැබලි සඳහා) |
| 7. | 16639/15 | 159-6288 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 8. | 30503/15 | 118-2514 | යතුරු පැදිය |
| 9. | 14893/15 | චැසි අංකය 50-426029 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 10. | 40045/16 | SG - ZO 1211 | යතුරු පැදිය |
| 11. | 42247/17 | SG - JX 1976 | යතුරු පැදිය |
| 12. | AR1423/20 | SG - BFA - 8437 | Scooty යතුරු පැදිය |
| 13. | 42826/17 | SG- TF - 9730 | යතුරු පැදිය |
| 14. | 66113/19 | SG - BDQ- 8511 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 15. | 42339/17 | UPMC - 8092 | යතුරු පැදිය |
| 16. | 58905/18 | BFQ - 6181 | යතුරු පැදිය |
| 17. | 59615/18 | SG - UX - 2765 | යතුරු පැදිය (කැබලි සඳහා) |
| 18. | 41029/16 | BAA- 0471 | මහේන්ද්‍රා මැක්ෂිමෝ ලොරි රථය |
| 19. | 45554/17 | SG - PV 6821 | ලොරි රථය |
| 20. | 35270/16 | 68-2430 | ලොරි රථය |
| 21. | 51236/18 | LG - 5038 | TATA ලොරි රථය |
| 22. | 76657/20 | - | අග්‍රොටෙක් ජී. එම්. 12 වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 23. | 76721/20 | ENG No - 053546234 | 01 SUN FAANG වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 24. | 77748/20 | - | අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 25. | 73612/20 | S195GN SER No -2233 | සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 26. | 76789/20 | - | අත් ට්‍රැක්ටර් එන්ජිම හා ට්‍රේලරය (කැබලි සඳහා) |
| 27. | 76357/20 | ENG010213ARGIMEC | අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 28. | 77516/20 | AGRORECGAT 009492 | අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 29. | 39781/20 | - | මහ ට්‍රැක්ටර් ට්‍රේලරය (කැබලි සඳහා) |
| 30. | 78531/20 | - | අත් ට්‍රැක්ටර් එන්ජිම හා ටේලරය (කැබලි සඳහා) |
| 31. | AR1427/20 | - | සී පැන් වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම ට්‍රේලරය (කැබලි සඳහා) |
| 32. | 78797/20 | ලියාපදිංචි නොකරන ලද | අත් ට්‍රැක්ටරය හා ට්‍රේලරය (කැබලි සඳහා) |
| 33. | 79726/20 | අංක රහිත | SIFANG වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 34. | 78713/20 | අංක රහිත | SIFANG වර්ගයේ අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 35. | 80003/21 | ලියාපදිංචි නොකරන ලද | අත් ට්‍රැක්ටර් එන්ජිම (කැබලි සඳහා) |
| 36. | 80147/21<br>80146/21 | කැල්සයිඩ් ගල් කියුබ් 08 | |
| 37. | 81729/21<br>81617/21<br>81882/21<br>80730/21<br>80877/21<br>80466/21<br>80144/21 | | |
| 38. | අංක රහිත | වීදුරු බෝතල් තොගය | |
| 39. | අංක රහිත | බූලී තොගය | |
| 40. | අංක රහිත | බැරල් 25 | |

## කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණය

මෙම අධිකරණය ඉදිරියේ පැවති නඩුවලට අදාළව රාජසන්තක කරන ලද අයිතිවාසිකම් නොකියන ලද පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2021.05.29 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණය භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන යම් තැනැත්තෙක් සිටී නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින පෙ. ව. 9.45ට පෙර ස්වකීය හිමිකම් තහවුරු කළ යුතු ය.

03. වෙන්දේසිය පැවත්වෙන දින පෙ. ව. 8.30 සිට 9.30 දක්වා මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබාගෙන භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව පිළිනොගන්නා අවස්ථාවලද අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී භාණ්ඩ මිලදී ගන්නා තැනැත්තන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසියේ දී මිලදී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදී මුදලින්ම පමණක් ගෙවීම් කළ යුතු ය.

ජනික එස්. විජේතුංග,
මහෙස්ත්‍රාත් - කුලියාපිටිය.

2021 අප්‍රේල් මස 22 වැනි දින,
කුලියාපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

2021 වර්ෂයේ වෙන්දේසිය සඳහා නියමිත නඩු භාණ්ඩවල තක්සේරු මිල ගණන්

| *අනු. අංකය* | *නඩු අංකය* | *විස්තරය* |
|---|---|---|
| 01 | 63926 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 02 | 60780 | 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය |
| 03 | 60956 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 04 | 61985 | (i) 12.5Kg ප්‍රමාණයේ ලාෆ් ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 05 | 62673 | 5 ප්‍රමාණයෙන් ලාෆ් ගෑස් සිලින්ඩරය |
| 06 | 63773 | 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය |
| 07 | 69330 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 08 | 75888 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 09 | 77110 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 10 | 77483 | 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය |
| 11 | 79626 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප<br>(iii) කලු පාට ප්ලාස්ටික් ජල ටැංකිය |
| 12 | 81700 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 13 | 81714 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |

| අනු. අංකය | නඩු අංකය | විස්තරය |
|---|---|---|
| 14 | 64535 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 15 | 72549 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 16 | 74290 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 17 | 76028 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 18 | 76831 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 19 | 79761 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩර් හතරයි<br>(ii) ගෑස් ලිප |
| 20 | 84065 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 21 | 84482 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 22 | 83218 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 23 | 78893 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 24 | 84833 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය |
| 25 | 77099 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 26 | 77630 | ගෑස් ලිප |
| 27 | 77653 | (i) 12.5Kg ප්‍රමාණයේ ලිට්‍රෝ ගෑස් සිලින්ඩරය<br>(ii) ගෑස් ලිප |
| 28 | 56033 | කළු පාට ප්ලාස්ටික් ජල ටැංකිය |
| 29 | 73060 | මෝටර් බයික් සෙල්ෆෝන් චාජරය |
| 30 | 79149 | ජල කරාමය |
| 31 | 81812 | ජංගම දුරකථන චාජරය |
| 32 | 66319 | යතුරු පැදි අලංකරණ උපකරණයක් |
| 33 | 81810 | විදුලි පන්දමක් |
| 34 | 72129 | ත්‍රී රෝද රථ කණ්නාඩියක් |
| 35 | 48199 | ලේස් රෙදි යාර් 1/2 |
| 36 | 73064 | ජල උපකරණයක් |
| 37 | 38514 | කාන්තා අත් බෑගයක් |
| 38 | 79144 | පියන සහිත කප් එකක් |
| 39 | 79137 | කෙවිල්ටන් විදුලි ස්විචය |
| 40 | 73062 | ජංගම දූකතන චාජරය |
| 41 | 72120 | බවුත් එකක් |
| 42 | 73508 | ප්ලාස්ටික් කරාමය |
| 43 | 80319 | ප්ලාස්ටික කෑම පෙට්ටිය |
| 44 | 73057 | ආරක්ෂක හිස් වැසුම |

අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් ඉදිරිපත් කර ඇති 422 වන චක්‍රලේඛය ප්‍රකාර වෙන්දේසි කිරීමට නියමිත නඩු භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | වර්ගය | ප්‍රමාණය (කියුබ්) | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|---|
| 01 | 84119 | බොරළු | 03 | | |
| 02 | 84689 | ” | 01 | | |

| අනු. අංකය | නඩු අංකය | වර්ගය | ප්‍රමාණය (කියුබ්) | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|---|
| 03 | 84616 | බොරළු | 01 | | |
| 04 | 83967 | ” | 01 | | |
| 05 | 83896 | ” | 1/4 | | |
| 06 | 83893 | ” | 03 | | |
| 07 | 83891 | ” | 03 | | |
| 08 | 82994 | ” | 03 | | |
| 09 | 82826 | ” | 03 1/2 | | |
| 10 | 82110 | ” | 01 | | |
| 11 | 82782 | ” | 01 | | |
| 12 | 82752 | ” | 03 | | |
| 13 | 82564 | ” | 03 | | |
| 14 | 82563 | ” | 03 | | |
| 15 | 81242 | ” | 01 | | |
| 16 | 80815 | ” | 01 | | |
| 17 | 79274 | ” | 03 | | |
| 18 | 79120 | ” | 01 | | |
| 19 | 73817 | ” | 1 1/2 | | |
| 20 | 73818 | ” | 1 1/2 | | |
| 21 | 73821 | ” | 1/2 | | |
| 22 | 73157 | ” | 1/4 | | |
| 23 | 69566 | ” | 01 | | |
| 24 | 93777 | ” | 01 | | |
| 25 | 64014 | ” | 03 | | |
| 26 | 63887 | ” | 03 | | |
| 27 | 85338 | ” | 03 | | |
| 28 | 85585 | ” | 03 | | |
| 29 | 84468 | ” | 03 | | |
| 30 | 88814 | ” | 03 | | |
| 31 | 88815 | ” | 03 | | |
| 32 | 88816 | ” | 03 | | |
| | **එකතුව** | | **65 1/2** | | |

**මැටි**

| | | | |
|---|---|---|---|
| 01 | 73469 | මැටි | 01 |
| 02 | 85875 | මැටි | 03 |
| 03 | 85876 | මැටි | 03 |
| | **එකතුව** | | **07** |

**පස්**

| | | | |
|---|---|---|---|
| 01 | 80934 | පස් | 03 |
| 02 | 80816 | ” | 01 |
| 03 | 76514 | ” | 03 |
| 04 | 73835 | ” | 3/4 |
| 05 | 73159 | ” | 03 |
| 06 | 70767 | ” | 03 |
| 07 | 69418 | ” | 03 |

| අනු. අංකය | නඩු අංකය | වර්ගය | ප්‍රමාණය (කියුබ්) | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|---|
| 08 | 64611 | ” | 03 | | |
| 09 | 85884 | ” | 03 | | |
| 10 | 86778 | ” | 01 | | |
| 11 | 87216 | ” | 01 | | |
| 12 | 87217 | ” | 01 | | |
| 13 | 87218 | ” | 01 | | |
| 14 | 87595 | ” | 01 | | |
| 15 | 88841 | ” | 02 | | |
| 16 | 88839 | ” | 02 | | |
| | **එකතුව** | | **31 3/4** | | |
| 01 | 84323 | කළුගල් | 02 | | |
| 02 | 70891 | ” | 3/4 | | |
| | එකතුව | | 02 3/4 | | |

* යන්ත්‍රයක් ලෙස විකිණිය හැකි (අධිකරණ අමාත්‍යාංශ 08/2013 (II) ප්‍රකාරව)

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය (කියුබ්) | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | 24900 (බැකෝ) | මිට්ෂුබිස් 3 වර්ගය | | |
| 02 | 15374 | හිතාචි ලැන්ඩ් EX 30 | | |

**ප්‍රසිද්ධ වෙන්දේසිය සඳහා අනුමැතිය ලබාගැනීම**

වෙන්දේසිය පැවැත්වෙන දිනය : 2021.05.29

අධිකරණය : මහෙස්ත්‍රාත් අධිකරණය, කුලියාපිටිය

**මෝටර් රථ වාහන කොමසාරිස් ජනරාල් විසින් තක්සේරු වාර්තා ලබා ගෙන ඉදිරියේ කළ යුතු රථවාහන**

* අමතර කොටස් ලෙස විකිණිය යුතු බවට නිර්දේශිත

| අනු. අංකය | නඩු අංකය | වාහනය | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | 79286 | 24 - 9363 දරන ලොරි රථය | | |
| 02 | 98162 | 40 - 9894 දරන ලොරි රථය | | |
| 03 | ඒ. ආර්. 924/17 | සීෆෑන් අත්ට්‍රැක්ටරය | | |
| 04 | 1604/21 | 188AA 751264 යතුරු පැදිය | | |
| 05 | ඒ. ආර්. 1350/14 | VA - 9232 දරන යතුරු පැදිය | | |
| 06 | ඒ. ආර්. 1235/17 | MG -0722 දරන යතුරු පැදිය | | |
| 07 | 1607/19 | BFG - 3299 දරන යතුරු පැදිය | | |

* වාහනයක් ලෙස විකිණිය හැකි (අධිකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ 08/13 (II) ප්‍රකාරව)

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩය | වෙනත් කරුණු | නිර්දේශය |
|---|---|---|---|---|
| 01 | 19015 | QR - 9651 දරන ත්‍රීවීල් රථය | | |
| 02 | 71221 | PQ - 3230 දරන ඩිමෝ බට්ටා ලොරිරථය | | |
| 03 | 73013 | 43 - 2671 දරන ලොරි රථය | | |
| 04 | 11812 | 41- 3428 දරන ලොරි රථය | | |
| 05 | 1024 | 28- 9996 දරන ලොරි රථය | | |
| 06 | 76816 | JP - 6134 දරන යතුරු පැදිය | | |
| 07 | 1603/19 | BCR - 8293 දරන යතුරු පැදිය | | |
| 08 | 1605/19 | BBC -0020 දරන යතුරු පැදිය | | |
| 09 | ඒ. ආර්. 1312/20 | TA - 6093 දරන යතුරු පැදිය | | |
| 10 | ඒ. ආර්. 1918/15 | HJ - 4196 දරන යතුරු පැදිය | | |
| 11 | ඒ. ආර්. 1234/17 | 142 - 6910 දරන යතුරු පැදිය | | |
| 12 | ඒ. 2194/17 | TX - 2267 දරන යතුරු පැදිය | | |

05-307

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - අවිස්සාවේල්ල

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජ සන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2021.05.29 වැනි දින පෙ. ව. 10.00ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් විය යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළු ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාර ගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍ය සඳහා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

කේ. එම්. ජේ. පී. සමරසිංහ,
මහෙස්ත්‍රාත්,
අවිස්සාවේල්ල.

2021 අප්‍රේල් මස 28 වැනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 25866 | ගෑස් ලිප් | 01 |
| 02 | 39213 | සවල් | 01 |
| 03 | 42101 | විල්බැරෝ | 01 |
| | | ගැරුම් වට්ටි | 01 |
| | | යකඩ ඉනි | 01 |
| | | බටපොතු කුඩ | 01 |
| | | උදළු | 01 |
| | | විදුලි පන්දම් | 01 |
| 04 | 34190 | සවල් | 10 |
| 05 | 47501 | අලවංගු | 01 |
| | | ගල්කටු | 01 |
| | | කුළුගෙඩි | 01 |
| | | පොරව | 01 |
| | | උදළු | 01 |
| | | නයිලෝන් කඹ | 01 |

| අනු. අංකය | නඩු අංකය | අයිතමය | ප්‍රමාණය |
|---|---|---|---|
| 06 | 35829 | ගෑස් ලිප් | 01 |
| 07 | 49839 | ගිල්වන වතුර මෝටර් | 01 |
| | | වතුර බට | 01 |
| | | උදළු | 01 |
| | | කුඩා කුඩ | 03 |
| | | ගැරුම් වට්ටි | 01 |
| 08 | 52116 | ප්ලාස්ටික් තාච්චි | 02 |
| 09 | 50205 | සවල් | 02 |
| 10 | 49607 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 11 | 46040 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 12 | 53637 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 13 | 55164 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 14 | 57150 | යකඩ ඉනි | 01 |
| | | හිස් තීන්ත බාල්දි | 01 |
| | | උදළු | 01 |
| | | බොලොක්කය සහිත කඩු | 01 |
| 15 | 55923 | ගෑස් ලිප් | 01 |
| 16 | 54895 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 17 | 51029 | බාල්දි | 01 |
| | | කුඩ | 02 |
| | | ගැරුම් වට්ටි | 01 |
| 18 | 54396 | බාල්දි | 01 |
| 19 | 58246 | ඉලෙක්ට්‍රික් මැෂින් | 01 |
| 20 | 59067 | ගෑස් ලිප් | 01 |
| | | කුඩා ගෑස් සිලින්ඩර් | 01 |
| 21 | 60398 | බට පතුරු කුඩ | 01 |
| | | උදැල්ල | 01 |
| 22 | 60424 | බාල්දි | 01 |
| | | කැට කුඩ | 01 |
| 23 | 60400 | බට පතුරු ගැරුම් වට්ටි | 01 |
| 24 | 57272 | යකඩ බාල්දි | 01 |
| 25 | 49685 | යකඩ තාච්චි | 01 |
| | | නිල් පාට ප්ලාස්ටික් බකට් | 01 |
| 26 | 50058 | ජබොස් වර්ගයේ වතුර බට | 01 |
| | | අඩි 14ක් දිග වයර් | 01 |
| | | අඩි 50ක් දිග වතුර බට | 01 |
| | | ඉල්ලං උදලු | 02 |
| | | නයිස් වර්ගයේ කලු සෙරෙප්පු | 01 |
| | | බාටා වර්ගයේ සෙරෙප්පු | 01 |
| | | ජංගම දුරකථන | 01 |
| 27 | 49431 | යකඩ සවල් | 01 |
| | | බාල්දි | 02 |
| 28 | 58701 | ඇලුමිනියම් කොරොස් | 01 |
| 29 | 58706 | කැට කුඩ | 01 |
| 30 | 58703 | ඇලුමිනියම් කොරොස් 01 | 01 |
| 31 | 58705 | බාල්දි | 01 |
| 32 | 55996 | ඇලුමිනියම් මුට්ටි | 01 |
| 33 | 50001 | යකඩ බාල්දි | 01 |
| | | සවල් | 01 |
| 34 | 60397 | අත් කුඩ | 01 |
| | | ඉල්ලං කුර | 01 |
| 35 | 60399 | කුඩා කුඩ | 01 |
| 36 | 60402 | ගැරුම් වට්ටි | 02 |
| 37 | 47737 | ඉල්ලං වට්ටි | 01 |
| 38 | 55251 | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 39 | 58593 | යකඩ | 01 |
| | | ගැරුම් වට්ටි | 01 |
| | | කුඩා | 01 |
| | | උදලු | 01 |
| 40 | 59824 | ගැරුම් වට්ටි | 01 |
| 41 | 56211 | නිල් පැහැති ඔක්සිජන් ටැංකි | 01 |
| | | ටැංකියට සවි කර ඇති බට | 01 |
| 42 | 61483 | පතල් කුඩ | 01 |
| | | උදළු | 01 |
| 43 | 47686 | කුඩ | 01 |
| | | ගැරුම් වට්ටි | 01 |
| 44 | | වීදුරු බෝතල් තොගයක් | 01 |
| 45 | | බැරල් | 50 |
| 46 | | බූලි | 100 |
| 47 | | වැලි කියුබ් | 05 |

05 -306

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීම්

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : බ්‍රවුන් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 72033
ලියාපදිංචි කාර්යාලය : අංක 521/A, රාජපක්ෂ එස්ටේට්, තබ්බෝව, තබ්බෝව, නාත්තන්ඩිය
ලියාපදිංචි දිනය : 2010.04.26

වෝටර්ස් සෙක්‍රටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

05 - 183

## සයිශි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
## සමාගම් ලියාපදිංචි අංකය PV 83109

සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2021 අප්‍රේල් මස 23 වැනි දින සමාගමේ පැවති විශේෂ මහා සභා රැස්වීමේ දී සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319(1)(b) වගන්තිය යටතේ මෙම සමාගම 2021 අප්‍රේල් මස 23 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

ජී. කුමාරස්වාමි,
අධ්‍යක්ෂ.

2021 අප්‍රේල් මස 29 වැනි දින.

05 - 209/1

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

දකුණ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ, පත්තඩුවන, දේවාලවත්ත අංක 111/11 හි පදිංචි ජා. හැ. අංක 786024110V දරන රාජපක්ෂ තේවගේ ක්‍රිෂාන්ති දිලීෂා රාජපක්ෂ වන මා හට දකුණ විදේශගතව සෞදි ආරාබියේ සේවය කරන ගම්පහ දිස්ත්‍රික්කයේ, මිනුවන්ගොඩ, පත්තඩුවන, දේවාලවත්ත අංක 111/11හි පදිංචි ජා. හැ. අංක 731920877V දරන සූරිය ආරච්චිගේ සෝමසිරි යන අය විසින් මා හට ඇටෝර්නි බලයක් වර්ෂ 2020 මාර්තු මස 06 දින පවරන ලදී. එය මාලිකා කුමාරි දිසානායක ප්‍රසිද්ධ නොතාරිස් මහත්මිය විසින් සකස් කර ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක 1075 යටතේ ලියාපදිංචි කරන ලදී. මෙම ඇටෝර්නි බලපත්‍රය තවදුරටත් බලාත්මක වී තිබීම අවශ්‍ය නොවන බැවින්, එය අවලංගු සහ බල රහිත කරන බව මෙයින් රාජපක්ෂ තේවගේ ක්‍රිෂාන්ති දිලීෂා රාජපක්ෂ වන මම මජනතාවට සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට දන්වා සිටිමි.

රාජපක්ෂ තේවගේ ක්‍රිෂාන්ති දිලීෂා රාජපක්ෂ.

05 - 103

---

## සයිශි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්
## සමාගම් ලියාපදිංචි අංකය PV 83109

2007 අංක 07 දරන සමාගම් පනතේ 346(1) වගන්තිය යටතේ සමාගමේ ඇවරකරු පත්කිරීමේ දැන්වීම

කොළඹ 04, කාසල් පටුමගේ, අංක 11හි තුන්වන මහලෙහි පදිංචි ජෙරාඩ් ජීවනන්තන් ඩේවිඩ් වන මා 2021 අප්‍රේල් මස 23 වැනි දින කොළඹ 07, මල් මාවත, අංක 06 දරන ස්ථානයේ පිහිටි සයිශි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ් හි පැවති විශේෂ මහා සභා රැස්වීමේ සාමාන්‍ය යෝජනා සම්මතයෙන් එම සමාගමේ ඇවරකරු වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ්,
ඇවරකරු,
සයිශි ඒෂියා (ප්‍රයිවට්) ලිමිටඩ්.

3 වන මහල, අංක 11,
කාසල් පටුමග,
කොළඹ 04,
2021 අප්‍රේල් මස 29 වැනි දින.

05 - 209/2

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

උඩුගොඩ, මහරංගල්ල හි පදිංචි දහනායක විදානලාගේ අමිත් ලක්මාල් දහනායක (ජා.හැ.අ.198921510039) වන මා විසින් එල්.ඒ.බන්දුල සමරසේකර ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2020 ක්වූ අගෝස්තු මස 21 වැනි දින ලියා සහතික කරන ලද අංක 2349 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ක්‍රියාවන් කිරීම සඳහා මාගේ සැබෑ සහ එකම නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් උඩුගොඩ, කහටගහමුල හි පදිංචි මැද්දුම පෙරුමාල් ආරච්චිල්ලාගේ සුජිත් වික්‍රමසිංහ (ජා.හැ.අ. 833111370 v) යන අයව පත් කරන ලද අතර, එය රත්නපුර පිහිටි සහකාර රෙජිස්ට්‍රාර් ජෙනරාල් ඌව සබරගමුව පළාත් කලාප කාර්යාලයේ 27 වන කාණ්ඩයේ 63 දරන පත්‍රිරුවේ 794 දරන දින පොත් අංකය යටතේ 2020.09.08 වෙනි දින ලියාපදිංචි කර ඇති අතර, එකී අංක 2349 දරන ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ට කරන බව මින් සැම සියලුදෙනාටම දන්වා සිටිමි. ඒ අනුව ඉහත කී අංක 2349 දරන ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් බල නොපවතින බව ද එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී ඇටෝර්නි බලකරු විසින් මින් ඉදිරියට කරනු ලබන සියලුම ක්‍රියාවන් කිසිදු වලංගුතාවයක් නොමැති බවත් ප්‍රකාශ කර සිටිමි. තවද මා විසින් කිසිදු ඇටෝර්නි බලයක් මෙතැන් පටන් කිසිවෙකුට ප්‍රදානය කර නැති බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනයාටත් දැනුම් දෙමි.

ඇටෝර්නි අධිපති,
දහනායක විදානලාගේ අමිත් ලක්මාල් දහනායක.

05-184

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

මඩකලපුව, ඒරන්ස් පටුමඟ, අංක 18 හිදි පදිංචි නාගප්පර් මුරුගුප්පිල්ලෙයි කන්දසාමි යන අයට වත්තල, හැඳල, නායකකන්ද, ශාන්ත මේරිස් පාර, අංක 12/7-B හි පදිංචි වර්තමාන ලිපිනය 6415, 23rd Avenue, Montrel (Quebec) HIT 3N2, Canada හි පදිංචි නාගරාජා විවේකානන්දරාජා වන මා ප්‍රසිද්ධ

නොතාරිස්/නීතිඥ මේරිස් පෙකුයින් නොටරි (3250 east jean-Taloni Montrel quebec Canada H2A 1W1) ඉදිරිපිටදී අත්සන් කරන ලද 27.03.2017 දිනැති මඩකලපුව, නැගෙනහිර කොට්ඨාස, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 05.05.2017 දිනැති 300 වන අනු අංකයේ 25 වැනි පොතින් 18 වැනි ඡේදයේ ලියාපදිංචි කර තිබූ විශේෂ ඇටෝර්නි බලය අවලංගු කරන බව ශ්‍රී ලංකා රජයට මෙන්ම මහජනතාවට ද මෙයින් දැනුම් දෙමි. මින් පසු ඉහත අයගේ කිසිම ක්‍රියාවකට මා වග නොකියන බව ද වැඩිදුරටත් දැනුම් දෙමි.

නාගරාජා විවේකානන්දරාජා.

05 -186

---

**අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම**

ෂිරාස් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය හි ලංකා ඔරෙක්ස් ලීසිං කම්පැනි පීඑල්සී (ලියාපදිංචි අංක PQ 70) යන ආයතනය ප්‍රසිද්ධ නොතාරිස් මුල්ලේගම මුදියන්සේලාගේ කාංචනා කුමාරි විසින් ලියා සහතික කරන ලද අංක 631 සහ 2011.02.15 දරන අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය යටතේ තම ඇටෝර්නි බලකරු වශයෙන් කළ පත්කිරීම මෙයින් අවලංගු කරනු ලැබේ.

තවද එකී අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර ලේඛනයේ A813 කාණ්ඩයේ 293 වන පත් ඉරුවේ දිනපොත් අංක 7826 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ,
ෂිරාස් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අංක 135/1, ගාලුපාර,
දෙහිවල.

05 - 221

---

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
**(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)**

1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනයයි

කේ. එම්. එස්. තුෂාර
ගිණුම් අංක : 0049 5000 3540

1990 අංක 04 දරණ බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වෙනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2020/12/16 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි දහසය ලක්ෂ අසූ දෙදහස් හයසිය පහයි ශත විස්සක (රු.21,682,605.20) මුදලද, 2020 නොවැම්බර් මස 10 වැනි දින සිට අංක. 1644, 1396, 2486 සහ 2587 දරණ උකස් බැඳුම්කර මත අයවියයුතු මුළුමුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි හැට ලක්ෂ හත් දහස් හාරසිය විසි එකයි ශත දහතුනක (රු. 16,007,421.13) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් විසි හය ලක්ෂ තිස් හය දහස් අටසිය තුනයි ශත පනස් පහක (රු. 2,636,803.55) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විසිඅටක් (28%) බැගින් වූ පොළියද, දැන්වීම් ගාස්තුද, ප්‍රචාරණ වියදම්ද, දරන්නට සිදුවූ ගාස්තුද, වෙනත් තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛණයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2021 අප්‍රේල් මස 16 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2021 අප්‍රේල් මස 07 වැනි දින " දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි උපලේඛන අංක 01හි සඳහන් දේපළ 2021.06.16 දින පෙ. ව. 10.30ට ද, උපලේඛන අංක 03හි සඳහන් දේපළ 2021.06.16 දින පෙ. ව. 11.00ට ද, උපලේඛන අංක 02හි සඳහන් දේපළ 2021.06.17 දින පෙ. ව. 10.30ට පිහිටි ස්ථානයේදී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන කේ. පී. එන්. සිල්වා යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**ඉහත කී උපලේඛනය**

1. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ වැලිගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ පරණකඩේ අංක 382 A ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ වැලිගම පරණ වීදිය ග්‍රාමයේ පිහිටි "කර්ටාටම්බිය ටන්ඩල්වත්ත නොහොත් කරුහන්ඩාල් තෝට්ටම් හි ලොට් D සහ E හි බෙලිගහවත්ත නොහොත් කොරටුව සහ හොදිහට්ටිය වත්ත නොහොත් ගෙදරවත්ත හී ලොට් A සහ B අඩංගු ඒකාබද්ධ ඉඩමේ ලොට් 1 හී ඒකාබද්ධ ලොට් $1A,1B^1,1B^3$ " යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච්. එල්. ඒ. එම්. හිෂාම් (2013.03.05 දින මනින ලද) 2013 මාර්තු මස 10 වැනි දින හා අංක 2618 දරණ පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට : අංක 2618 දරණ පිඹුරේ ලොට් 02 සහ 06 (පාර) නැගෙනහිරට : අංක 2618 දරණ පිඹුරේ ලොට් 06 (පාර) දකුණට :අංක 2618 දරණ පිඹුරේ ලොට් 04 සහ 05 බස්නාහිරට: අංක 2618 දරණ පිඹුරේ ලොට් 02 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම පහක් (A:0 R:0 P: 10.5) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමඟ අංක 2618 දරණ එකී පිඹුරට අනුව වෙළුම / පත්‍රිරුව P 07/130 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 2618 දරණ එකී පිඹුරේ ලොට් 06 දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

(උකස් බැඳුම්කර අංක 1644 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ උඩුගහ පත්තුවේ සීතාවක මහ නගර සභා සීමාවන් තුළ සහ හංවැල්ල ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ සීතාවක අංක 432 B ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අවිස්සාවේල්ල පිහිටි "සියඹලගහගාව වත්තේ කොටසක්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී එම් ගමගේ යන අය විසින් සාදන ලද 2012 ජනවාරි මස 30 වැනි දින හා අංක 2063 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්: උතුරට 12 හි කොටස ලොට් 313 අවි නැගෙනහිරට: කුඹුර දකුණට: 14 හි කොටස ලොට් 313 අවි බස්නාහිරට: පන්සල පාර යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් එකළොහයි දශම එකයි හතක් (A:0 R:1 P: 11.17) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 2063 දරන එකී පිඹුරට අනුව වෙළුම / පත්ඉරුව P232/106 යටතේ අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 1396 සහ 2486 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

3. දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරළේ වැලිගම නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහා ලේකම් කාර්යාල කොට්ඨාසයේ පරණකඩේ අංක 382 A ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ වැලිගම පරන වීදිය ග්‍රාමයේ පිහිටි ගාල්ල - මාතර පාර වරිපනම් අංක 267 දරණ "කර්වාටම්බිය ටන්ඩල්වත්ත නොහොත් කරුහන්ඩාල් තෝට්ටම් හි ලොට් D සහ E හි සහ බෙලිගහවත්ත නොහොත් කොරටුව නොහොත් හොදිහිට්ටිය වත්ත නොහොත් ගෙදරවත්ත හි ලොට් A සහ B අඩංගු ඒකාබද්ධ ඉඩම්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එච් එල්. ඒ. එම්. හිෂාම් (2013.03.05 දින මනින ලද) 2013 මාර්තු මස 10 වැනි දින හා අංක 2618 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් 5 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : අංක 2618 දරන පිඹුරේ ලොට් 03 නැගෙනහිරට : අංක 2618 දරණ පිඹුරේ ලොට් 03 (පාර) දකුණට :ගාල්ල සිට මාතර දක්වා ප්‍රධාන පාර බස්නාහිරට: අංක 2618 දරන පිඹුරේ ලොට් 04 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයක් (A:0 R:0 P:10) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියළු දේ සමග අංක 2618 දරන එකී පිඹුරට අනුව වෙළුම / පත්ඉරුව P 118/125 යටතේ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(උකස් බැඳුම්කර අංක 2587 මගින් හා ඒ යටතේ උකස් කොට ඇප කොට ඇත.)

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

සමාගම් ලේකම්

05-218

**නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී. එල්. සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම වෙන්දේසිය COVID ක්‍රියාපිළිවෙතට අනුගත වෙමින් සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද දැඩි මාර්ගෝපදේශයන්ට අනුකූලව පවත්වනු ලැබේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව නාවලපිටියේ සිය ප්‍රධාන ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන තේනුක ඔටෝ සර්විස් යන නාමය විලාසය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් කරගෙන යන නාවලපිටිය පදිංචි කතලුව වැලිගමගේ මල්ලිකා විජේරත්න (පළමුවන ණයගැණුම්කරු) හා නාවලපිටිය පදිංචි හේවා වඩිගේ තිළිණ සඳරුවන් (දෙවන ණයගැණුම්කරු) සහ නාවලපිටිය පදිංචි හේවා වඩිගේ ඉෂාර තෙනුක සඳරුවන් (තුන්වන ණයගැණුම්කරු) වශයෙන් ද, නැෂනල් ඩිවෙලොප්මන්ට් බෑන්ක් පී එල් සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට උකස් කර ඇති පහත විස්තර කර ඇති දේපළ.

එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*1 වන විකිණීම.*- **2021 ක් වූ මැයි මස 31 වැනි දින පෙ. ව. 10.30ට**

*දේපළ විස්තරය :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළයේ, පස්බාගේ උඩුබුලත්ගම පත්තුවේ, නාවලපිටිය මහනගර සභා සීමාවේ පස්බාගේ කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බළවාගම ග්‍රාම නිලධාරී වසමේ අංක 6 දරන නාගරික කොට්ඨාසයේ පිහිටි කොත්මලේ පාරේ වරිපනම් අංක 177ඒ සහ 197 දරන ''ඉලුක්පිටිය, ඉලුක්පිටිය වනාත, ඉලුක්පිටිය කුඹුර සහ උඩඉලුක්පිටිය වත්ත '' (හිස් ඉඩමේ කොටසක්) නමැති යාබද ඉඩම්වලට බලයලත් මිනින්දෝරු පී. ඥණප්‍රකාසම් විසින් මැන සාදන ලද අංක 9046 සහ 2008.05.29 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 2 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස ප්‍රමාණය රූඩ් එකකුත් පර්චස් විසිනවයයි දශම හතරක් (අ. 0, රූ. 1, පර්. 29.4) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් වේ.

*දේපළට පිවිසීම.*- නාවලපිටිය කඩමණ්ඩියේ සිට කොත්මලේ පාරේ මීටර් 650ක් පමණ 1වන කි.මී. කණුව දක්වා ගමන් ගත් පසු අදාල දේපළ මෙම පාරේ පිහිටා තිබේ.

*2 වන විකිණීම.*- **2021 ක් වූ මැයි මස 31 වැනි දින පෙ. ව. 10.15ට**

*දේපළ විස්තරය :*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළයේ, පස්බාගේ උඩුබුලත්ගම පත්තුවේ, නාවලපිටිය මහනගර සභා සීමාවේ පස්බාගේ කෝරළයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 1084 දරන ඉඹුල්පිටිය ග්‍රාම නිලධාරී වසමේ අංක 06 දරන නාගරික කොට්ඨාසයේ කොත්මලේ පාරේ වරිපනම් අංක 197බී දරන වර්තමානයේ ඉලුක්පිටිය වශයෙන් හඳුන්වන ''ඉලුක්පිටිය, උඩඉලුක්පිටිය වනාත සහ උඩඉලුක්පිටිය වත්ත '' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. ඥණප්‍රකාසම් විසින් මැන සාදන ලද අංක 12021 සහ 2018.12.16 දින දරන පිඹුරේ නිරූපිත ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද බෙදා වෙන්කළ බිම් කොටස සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි, පළතුරු ආදී සෑම සියලු දේත් වේ. ඉඩමේ ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස් අටක් (අ. 0, රූ. 1, පර්. 38) විශාල ඉඩම සහ අංක 10204 දරන පිඹුරේ නිරූපිත අඩි 15ක් පළල පාරේ මාර්ග අයිතිය සහ කාණුවට වෙන්කළ බිම් කොටස සමගින් ද වේ.

*දේපළට පිවිසීම.*- නාවලපිටිය කඩමණ්ඩියේ සිට කොත්මලේ පාරේ මීටර් 650ක් පමණ 1වන කි.මී. කණුව දක්වා ගමන් ගත් පසු අදාළ දේපළ මෙම පාරේ පිහිටා තිබේ. (ඉහත සඳහන් ඉඩම් දෙකටම මෙම මාර්ගයේ ලඟා විය හැක).

*3 වන විකිණීම.*- **2021 ක් වූ මැයි මස 31 වැනි දින ප. ව. 1.00ට**

*දේපළ විස්තරය :*

